(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(7).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 ජූලි 25 සිකුරාදා**

**2025 අගෝස්තු 05 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

කථානායකතුමා,— 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනා සම්මතය,— පාර්ලිමේන්තුවේ 2025.04.08 දිනැති න්‍යාය පත්‍රයේ සඳහන් අංක පා.29/2025 දරන යෝජනා සම්මතය 2025 අප්‍රේල් 08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, එකී යෝජනාවේ ඇතුළත් චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂා කොට, සිය සොයාගැනීම් වාර්තා කරනු පිණිස 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 5(2) වන වගන්තිය සහ 6(ආ) වන වගන්තිය යටතේ (මෙහි මින් මතු "කමිටුව" නමින් සඳහන් කරනු ලබන) පරීක්ෂණ කමිටුවක් පත් කරනු ලැබූ හෙයින් ද;

එකී පනතේ 8(1)(ආ) වගන්තිය ප්‍රකාරව එකී කමිටුව විසින් කරුණු සොයා බලා, සිය තීරණ කථානායකතුමා වෙත 2025.07.21 දින දැනුම් දී තිබූ හෙයින් ද,

එම තීරණ ඇතුළත් වාර්තාව කථානායකවරයා විසින් 2025.07.22 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරනු ලැබූ හෙයින් ද;

කමිටුව සිය පරීක්ෂණය පවත්වා, ඉහත කී සභාගත කරන ලද වාර්තාවට අමුණා ඇති චෝදනා පත්‍රය තුළ පොලිස්පතිවරයාට එරෙහිව නගන ලද මුළු චෝදනා 23 අතරින් චෝදනා අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 13, 14, 15, 16, 17, 18, 19, 22 සහ 23 සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වරදකරු බව තීරණය කර ඇති හෙයින් ද;

පරීක්ෂණ කමිටුව විසින් වාර්තාගත කරන ලද සහ මෙම සභාවේ සභාගත කරන ලද එකී වාර්තාවේ සඳහන් වරදකරු බවට වන තීරණ පදනම් කර ගනිමින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(3) ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග,— රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යතිරේකය සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 19, 20, 21, 22 සහ 23 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2025 ජුනි 30 දිනැති අංක 2443/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජුනි 18 දිනැති අංක 2441/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 මැයි 21 දිනැති අංක 2437/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජුනි 13 දිනැති අංක 2440/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 අගෝස්තු 19 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

16/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය සහ තේ අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) තේ අපනයනය සැලකීමේදී ඉහත කාලසීමාව තුළ ජාත්‍යන්තර වෙළඳපොළේ ශ්‍රී ලංකාව අත්පත් කරගෙන සිටි ස්ථානය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

116/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය යහපාලන රජය සමයේ සිදු වූ මහ බැංකු බැඳුම්කර වංචාවක් සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් ඇති වූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව මඟින් චෝදනා එල්ල කරන ලද පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ බලපෑම කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

185/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තුරෙයි නීලාවනෙයි සිට කුරුක්කල්මඩම් දක්වා වූ ප්‍රදේශයන්හි අලුතින් ඉදිකළ යුතු හා පිළිසකර කළ යුතු කානු පද්ධති පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

218/2024

ගරු රෝහණ බංඩාර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු M-class වර්ගයේ දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එන්ජින්වල මුළු වටිනාකම කොපමණද;

(iii) එම එන්ජින් අතරින් මේ වනවිට ධාවනයට එක්කර ඇති එන්ජින් සංඛ්‍යාව හා ධාවනයෙන් ඉවත් කර ඇති එන්ජින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති M-class දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා කඩිනමින් අලුත්වැඩියා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

623/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ව්‍යාපාරයේ නිරත වී සිටින සංස්ථා/සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) පසුගිය රජය විසින් ඉහත සමාගම් සමඟ එළඹ ඇති ගිවිසුම් හේතුවෙන් ඛනිජ තෙල් මිල අඩු කළ නොහැකි බවත්, ඛනිජ තෙල් මිල අඩු කළහොත් අදාළ සමාගම්වලට වන්දි ගෙවීමට සිදු වන බවත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ප්‍රකාශ කර තිබෙන බව දන්නේද;

(iv) එම ප්‍රකාශයේ සත්‍ය/අසත්‍යභාවය දන්වන්නේද;

(v) එසේ නම්, අදාළ ගිවිසුම් සංශෝධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1075/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් විකල්ප වැඩපිළිවෙළකින් තොරව 2025 වර්ෂය තුළ අවලංගු කර ඇති මාර්ගගත ක්‍රමයට ආසන වෙන් කිරීමේ පහසුකම සහිත බස්රථ ගමන් වාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම අවලංගු කරන ලද බස්රථ ගමන් වාර වෙනුවෙන් අය කර ගන්නා ලදුව, එහෙත් මේ වනතෙක් නැවත ලබා දී නොමැති මුළු මුදල කොපමණද;

(iii) ඉහත සඳහන් බස්රථ ගමන් වාර අවලංගු කරනු ලබන අවස්ථාවලදී, ඒ බව මගීන්ට කල් ඇතිව දැනුම් දීමට සහ ඊට අදාළ මුදල් නොපමාව ආපසු ලබා දීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) මගීන්ගේ යහපත උදෙසා විනිවිදභාවයෙන් යුතුව මෙම කටයුත්ත සිදු කෙරෙන බව සහතික කිරීම පිණිස මාර්ගගත ක්‍රමයට ආසන වෙන් කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1081/2025

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයක නිරත වන මාලඹේ, කඩුවෙල පාරේ, අංක 362 ඩී දරන ලිපිනයේ සිය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන 'Park Properties (Private) Limited' යන ආයතනය විසින් දිගු කාලයක් තිස්සේ සිදු කර ගෙන යනු ලබන මූල්‍ය වංචා සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ පොලිස් ස්ථානවලට මේ වනවිට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ආයතනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ, මිරිහාන විශේෂ අපරාධ විමර්ශන අංශය විසින් සිදු කර ඇති විමර්ශනවල වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) ඉහත පැමිණිලිවලට අදාළව දිවයින පුරා විවිධ අධිකරණවල පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1083/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන්නි ප්‍රදේශයේ සිදු කරනු ලබන ගල් කැඩීමේ සහ පස් කැපීමේ කටයුතු සඳහා පළාත් සභා පරිපාලනයට අයත් කිසිදු ආයතනයකින් අවසර නොගෙන සෘජුවම මධ්‍යම රජයේ ආයතනවලින් අනුමතිය ලබා ගන්නා බවත්;

(ii) එම ක්‍රියාවලියේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන සම්බන්ධ වන බවත්;

(iii) කැනීම් කරන ඛනිජ සම්පත් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා මාර්ග පළාත් පාලන ආයතනවල පරිපාලනයට අයත් වන අවස්ථාවලදී පමණක් අදාළ පළාත් පාලන ආයතනයේ අනුමතිය ලබා ගන්නා බවත්;

(iv) ඒ අනුව, උතුරු පළාතේ සම්පත් පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමතියකින් තොරව පිට පළාත්වලට ගෙන යන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමතියකින් තොරව උතුරු පළාතේ සම්පත් පිට පළාත්වලට ගෙන යාමට ඉඩ දෙන්නේද;

(ii) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විකල්ප වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1091/2025

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 හා 2024 වර්ෂවලදී රාජ්‍ය කළමනාකරණ සේවා විභාග පැවැත් වූ බව දන්නේද;

(ii) එම එක් එක් විභාගයේ සමත් කිරීමේ ලකුණු වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2019 වර්ෂයේ විභාගයට අදාළව පුරප්පාඩු ගණනය කිරීමේ පදනම් දිනය කවරේද;

(iv) ඊට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) 2019 වර්ෂයේ රාජ්‍ය කළමනාකරණ සේවා (සීමිත) විභාගයට අදාළ බඳවා ගැනීමේ අවම ලකුණු කවරේද;

(vi) එම විභාගයෙන් ලකුණු 100ට ඉහළ ලබා ගන්නා ලද අයදුම්කරුවන් මේ වනවිට බඳවාගෙන තිබේද;

(vii) ඔවුන් බඳවා ගන්නා ලද වාර සංඛ්‍යාව කොපමණද;

(viii) පළමු වාරයෙන් පසු ඉතිරි අයදුම්කරුවන් බඳවාගත් ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2024 වර්ෂයේ රාජ්‍ය කළමනාකරණ සේවා (සීමිත) විභාගයට අදාළ සමත් කිරීමේ ලකුණු කවරේද;

(ii) එම විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) සමත් අයදුම්කරුවන් අතරින් මේ වනවිට බඳවාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) 2019 වර්ෂයේ ලකුණු 100ට ඉහළ ලබා ගත් අයදුම්කරුවන් බඳවාගෙන ඇති බැවින්, 2024 වර්ෂයේ විභාගයෙන්ද ලකුණු 100ට ඉහළ ලබා ගත් අයදුම්කරුවන් බඳවා ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1102/2025

ගරු සුරංග රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.01.01 දින වනවිට ශ්‍රී ලංකාවේ රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්තමාන රජය විසින් උපාධිධාරීන්ට ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එම රැකියා සංඛ්‍යාව එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ඉදිරි වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පවතින රජයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 අගෝස්තු 20 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

201/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පරිගණකවල තිබූ දත්ත මකා දැමීමේ සිද්ධිය වාර්තා වූ දිනය කවරේද;

(ii) එම දත්ත මකා දැමීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ නිලධාරීන්ගේ නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දත්ත මකා දැමීම හේතුවෙන් මහා පරිමාණ වංචා සඳහා අවස්ථාව විවෘත වූ බව දන්නේද;

(iv) ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

224/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් සුහුරු අධිකරණ ශාලා පිහිටුවීමට පොරොන්දු වී තිබේද;

(ii) ඒ අනුව මේ වනවිට සුහුරු අධිකරණ ශාලා බවට පත් කරන ලද අධිකරණ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය, සුහුරු අධිකරණ පද්ධතියක් බවට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) ඒ වෙනුවෙන් 2025 වර්ෂයට අදාළ විසර්ජන පනත මඟින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

262/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව මේ වනවිට එළඹ ඇති ගිවිසුම සභාගත කරන්නේද;

(ii) වර්තමාන රජය බලයට පත් වීමට පෙර එම ගිවිසුම සංශෝධනය කර ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංශෝධන කවරේද;

(iv) නව රජය බලයට පත් වීමෙන් පසු ඉහත ගිවිසුම සංශෝධනය කර තිබේද;

(v) එසේ නම්, එම සංශෝධන කවරේද;

(vi) එම සංශෝධන සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(vii) එම සංශෝධන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් කොන්දේසි විරහිතව පිළිගෙන තිබේද;

(viii) නොඑසේ නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කරන සංශෝධන කවරේද;

(ix) රජය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන හෝ යෝජනා අතරින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පිළිගන්නා ලද සංශෝධන හෝ යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

312/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් තෙල් ටැංකි ත්‍රිකුණාමල වරාය තුළ හෝ ඉන් පිටත පිහිටා තිබේද;

(ii) ත්‍රිකුණාමලයේ ඇති මුළු තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් තෙල් ටැංකි බදු දී තිබේද;

(iv) එසේ නම්, මෙම තෙල් ටැංකි බදු මත ලබා දී ඇති ආයතනවල සහ රටවල නම් කවරේද;

(v) මෙම තෙල් ටැංකි බදු දීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ත්‍රිකුණාමලය තෙල් ටැංකි ව්‍යාපෘතියේ සිදු කරන ලද නවතම ආයෝජනයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

339/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොලොන්නාව, මීතොටමුල්ල කසල කන්ද ව්‍යාපෘතිය හේතුවෙන්, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොතුවිල් කුඹුර ප්‍රදේශයේ පදිංචිකරුවන් ඉන් ඉවත් කරන ලද බව දන්නේද;

(ii) එලෙස ඉවත් කරන ලද පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් මේ වනවිට නිවාස ලබා දී ඇති පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) නිවාස ලබා දී නොමැති, එහෙත් මේ වනවිටත් එම ප්‍රදේශයේ පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට නිවාස ලබා දීමට සැලසුම් කර තිබේද;

(vi) එසේ නම්, එම සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

616/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොල්ලුපිටිය, ගෝල් ෆේස් (Galle Face) ටෙරස්හි, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියට අයත් ගොඩනැගිල්ලක් හා ඉඩමක් තිබෙන බවත්;

(ii) ඊට යාබද ඉඩමේ රේණුකා හෝල්ඩින්ග්ස් නමැති ආයතනය විසින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් ඇති වූ බලපෑම හේතුවෙන් මේ වනවිට එම ගොඩනැගිල්ල ගිලා බැසීමට ලක් වී ඇති බවත්;

(iii) ඒ සම්බන්ධයෙන් රේණුකා හෝල්ඩින්ග්ස් ආයතනයට එරෙහිව අධිකාරිය විසින් නඩුවක් පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්තමාන රජය විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව එම නඩුව සමථයකට පත් කර අදාළ ගොඩනැගිල්ල සහ ඉඩම රේණුකා හෝල්ඩින්ග්ස් ආයතනයට විකිණීමට සැලසුම් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

900/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගොඩ, ගල්ලස්ස ළමා හා මාතෘ රෝහලේ වෛද්‍යවරුන්, හෙද හෙදියන්, සුළු සේවකයන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටින්නේද;

(ii) එම රෝහලට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සපයා තිබේද;

(iii) එහි ළමා සායනය සහ මාතෘ සායනය මේ වනවිට පවත්වන්නේද;

(iv) එම සායන සඳහා අවශ්‍ය රසායනාගාර තාක්ෂණ පහසුකම් සපයා තිබේද;

(v) එම රෝහලේ ප්‍රමාණවත් ගිලන් රථ සංඛ්‍යාවක් තිබේද;

(vi) එම ගිලන් රථ සඳහා අවශ්‍ය රියදුරන් සහ සහායකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) ගිලන් රථ සඳහා ප්‍රමාණවත් පරිදි රියදුරන් සහ සහායකයන් සිටින්නේද;

(viii) නොඑසේ නම්, එම තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල ප්‍රමාණවත් පරිදි වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පහසුකම් තිබේද;

(ii) එම පහසුකම් භාවිතා කිරීමට සුදුසු තත්ත්වයක තිබේද;

(iii) රජයේ රෝහල් සඳහා හිඟව පවතින වෛද්‍ය උපකරණ හා යන්ත්‍ර කවරේද;

(iv) එම වෛද්‍ය උපකරණ හා යන්ත්‍ර අවශ්‍ය වන අංශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

958/2025

ගරු අජිත් ගිහාන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, පල්ලකන්දල් දේවස්ථානයේ ආගමික කටයුතු පවත්වාගෙන යාමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් බාධා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1101/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් කර්මාන්ත සඳහා ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ලබා දී ඇති එක් එක් පුද්ගලයා/සමාගම සහ ඉඩම ලබා දී ඇති කර්මාන්තය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින කර්මාන්ත කවරේද;

(iv) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින කර්මාන්ත තිබේ නම්, ඒවා කවරේද;

(v) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින කර්මාන්ත සඳහා ලබා දුන් ඉඩම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගන්නේද;

(vi) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1120/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා 1999 දී බඳවාගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ අභ්‍යාසලාභී පත්වීම් ස්ථිර කරන ලද දිනය කවරේද;

(iii) එම ස්ථිර කිරීම සඳහා උපදෙස්/චක්‍රලේඛය නිකුත් කරන ලද ආයතනය කවරේද;

(iv) එහිදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය කවරේද;

(v) එම උපදෙස් ලිපියේ/චක්‍රලේඛයේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත උපාධිධාරීන් අතරින් ස්ථිර කරන ලද සංඛ්‍යාව, එක් එක් රේඛීය අමාත්‍යාංශය, පළාත් සභා අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ ආයතනය අනුව සහ එක් එක් තනතුරු කාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් තනතුරු කාණ්ඩ සඳහා අදාළ ආරම්භක වැටුප, වැටුප් පරිමාණය සහ වැටුප් කේත අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ස්ථිර කිරීමෙන් පසුව ඉහත උපාධිධාරීන් සඳහා සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීමේ පටිපාටි සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒවා සකස් කරන ලද වර්ෂය කවරේද;

(v) ඒවායේ පිටපත් ඉදිරිපත් කරන්නේද;

(vi) සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පටිපාටි සකස් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(vii) සේවා ව්‍යවස්ථා අනුව උසස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 අගෝස්තු 21 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

676/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රශස්ත සේවාවක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට තාක්ෂණ නිලධාරීන්ගේ දායකත්වය ඉතා වැදගත් බව පිළිගන්නේද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින තාක්ෂණ නිලධාරීන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

735/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.02.09 වැනි දින ශ්‍රී ලංකාවේ විදුලිය බිඳවැටීමක් සිදු වූ බව දන්නේද;

(ii) එසේ නම්, එම විදුලිය බිඳවැටීමත් සමඟ විදුලි සැපයුම් ජාල ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා මේ දක්වා ගන්නා ලද කෙටි කාලීන හා දිගු කාලීන පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

808/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝාතනයට, පැහැරගැනීමට සහ පහරකෑමට ලක් වූ ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම ජනමාධ්‍යවේදීන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

832/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියා සඳහා යොමු කර ඇති බවට අනාවරණය වී ඇති බාලවයස්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් විදේශීය රැකියා සඳහා යොමු කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රමවේද කවරේද;

(iii) බාලවයස්කරුවන් විදේශ රැකියා සඳහා යොමු කිරීම පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

859/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බදු පදනම මත ලබා දී තිබෙන රජයේ ඉඩම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 153 ග්‍රාම නිලධාරි වසමේ, කොඩින්නෑව ගමේ පිහිටි අක්කර 100ක් පමණ විශාලත්වයකින් යුතු රජයේ ඉඩම අනවසරයෙන් එළි පෙහෙළි කර අස්වද්දා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ඉඩම එළි පෙහෙළි කර අස්වද්දා ඇත්තේ කවුරුන් විසින්ද;

(iv) එම පුද්ගලයන්ට ඒ සඳහා නීත්‍යානුකූල අයිතියක් තිබේද;

(v) ඔවුන් පොහොර සහනාධාරය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පොහොර සහනාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

868/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වූයේ කවරේද;

(ii) එම වැඩසටහන ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එමඟින් වාර්ෂිකව උපයනු ලබන ආදායම එක් එක් වාහන කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආදායම එකතු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වාහන වායු විමෝචන භාරකාර අරමුදල යනු කවරේද;

(ii) එය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) ඒ තුළින් රජයට ආදායමක් ලැබෙන්නේද;

(iv) එසේ නම්, එම ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

877/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන ‘දීමනා පත්‍ර’ (Deed of Grant) හෝ ‘ඉඩම් බලපත්‍ර’ (Land Permit) නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එහි පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) නඩු පවරන ලද පුද්ගලයන් අතරින් උක්ත කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටීද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිප දෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

955/2025

ගරු සුජීව දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මහාමාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව, දුම්රිය මාර්ග හරහා ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව සහ ඉදිකර ඇති උමං මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ඉදිකිරීම සඳහා වැය වී ඇති මුදල කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිකර ඇති ගුවන් පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ඉදිකර ඇති ස්ථාන කවරේද;

(iii) උතුරු දිග දුම්රිය මාර්ගයේ, මහව මංසන්ධිය හරහා ගුවන් පාලමක් ඉදිකිරීමට යෝජනා කර තිබුණේද;

(iv) වර්ෂ 2004 සිට 2014 දක්වා කාල වකවානුව තුළ එම ගුවන් පාලමේ ඉදිකිරීම් ආරම්භ කිරීම වෙනුවෙන් උත්සවයක් සංවිධානය කර තිබුණේද;

(v) එසේ නම්, එම උත්සවය සඳහා දරන ලද වියදම කොපමණද;

(vi) එම ගුවන් පාලම ඉදිකිරීම සඳහා ඉදිරියේදී පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

971/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ආයුර්වේද වෛද්‍ය විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) 1925 දී පිහිටුවා, 1941 දී නීතිගත කර, 1949 දී ගැසට් කරන ලද, යාපනය ශ්‍රී ලංකා ආයුර්වේද සිද්ධ වෛද්‍ය විද්‍යාලයට මේ වනවිට සිසුන් ඇතුළත්කර නොගැනීමට හේතු කවරේද;

(iii) එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) පාරම්පරික වෙදකම සම්බන්ධයෙන් කිසිදු දැනුමක් නොමැති විශ්වවිද්‍යාල උපාධිධාරීන් ආයුර්වේද දෙපාර්තමේන්තුවට පත් කිරීමට හේතු කවරේද;

(v) ඔවුන් තම ප්‍රශ්න අවබෝධ කර නොගන්නා බව පාරම්පරික වෛද්‍යවරුන් චෝදනා කරන බව දන්නේද;

(vi) ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vii) උතුරු පළාතේ පාරම්පරික වෛද්‍ය අධ්‍යාපනයේ සහ ආයුර්වේද අධ්‍යාපනයේ උන්නතිය උදෙසා දේශීය වෛද්‍ය විද්‍යාලවලට අනුමතිය දෙන්නේද;

(viii) ඒ සඳහා ගන්නා නීතිමය/පරිපාලනමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාරම්පරික වෛද්‍යවරුන්ට හැඳුනුම්පත්, වෛද්‍ය සහතික සහ උපාධි ලබාදීමට ආයතනයක් පිහිටුවන්නේද;

(ii) ඔවුන්ට බඳවා ගැනීමේ පටිපාටියක් හා වැටුප් පරිමාණයක් හඳුන්වා දෙන්නේද;

(iii) ඔවුන්ට රජයේ සහාය නොලැබීමට හේතු කවරේද;

(iv) ඔවුන්ගේ ලියාපදිංචිය/හැඳුනුම්පත අලුත් කිරීම/සායන අවසරය සඳහා රු. 5,000/- දක්වා මුදලක් ගෙවිය යුතු අතර එය ඔවුන්ට වැය බරක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

977/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආදේශකයන් 3081ක් සේවය කරන බව දන්නේද;

(ii) ඔවුන්ගේ සේවා කාලය කොපමණද;

(iii) තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන් පත් කිරීමට පියවර ගෙන තිබේද;

(iv) තැපැල් දෙපාර්තමේන්තුවේ පවතින ලියාපදිංචි ආදේශකයන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 අගෝස්තු 22 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

846/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති, රාජ්‍ය වැවිලි සමාගම් සතු ඉඩම් ප්‍රමාණය එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සමාගම් සතු ඉඩම් අතුරු බදු දී තිබේ නම්, එම ඉඩම් ප්‍රමාණය, අතුරු බදු ලබා ගෙන ඇති සමාගම්/ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අතුරු බදු දී ඇති ඉඩම් වෙනුවෙන් 2015 වර්ෂයේ සිට මේ දක්වා ලැබුණු බදු ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත බදු ආදායම නිසි පරිදි අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1024/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ප්ලාස්ටික් යොදා නිෂ්පාදනය කරනු ලබන කුඩා දරුවන්ගේ ආහාර අසුරණවල ප්‍රමිතිය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1068/2025

ගරු චානක මාදුගොඩ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් හිමියන් විසින් රජයට භාර දෙන ලද ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු වෙනුවට 'උරුමය' වැඩසටහන යටතේ සින්නක්කර ඔප්පු ලබා දීමට මේ වනතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව පිළිගන්නේද;

(ii) එසේ ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු භාර දෙන ලද පුද්ගලයන්ගේ ඉඩම් හිමිකම තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉහත සඳහන් ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු වෙනුවට සින්නක්කර ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නිශ්චිත කාල රාමුවක් තිබේද;

(iv) සින්නක්කර ඔප්පු ලබා ගැනීම පිණිස රජයට භාර දෙන ලද ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු සම්බන්ධයෙන් වන වර්තමාන තත්ත්වය පිළිබඳව අදාළ පුද්ගලයන්ට තොරතුරු ලබා ගත හැකි මාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1070/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම් කටයුතු නතර කර ඇති සහ මේ වනවිට භාවිතා කරනු නොලබන මාතර, නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම මුල්‍ය පිරිවැය දරා ඇති ආයතන කවරේද;

(iii) එම ගොඩනැගිලි සංකීර්ණය නඩත්තුව සහ ආරක්ෂාව වෙනුවෙන් වාර්ෂිකව දරන පිරිවැය කොපමණද;

(iv) ඉහත ගොඩනැගිලි සංකීර්ණය භාවිතයට ගැනීම සඳහා පවතින සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1073/2025

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන එක් එක් සංවර්ධන ව්‍යාපෘතියේ නම සහ ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ව්‍යාපෘති අතරින් මාතර නගර සීමාව තුළ ක්‍රියාත්මක කර ඇති එක් එක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය, ව්‍යාපෘතියේ ස්වභාවය, ව්‍යාපෘතියේ අරමුණු, ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල, ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මාතර ‘ගහබඩ උද්‍යානය’ සහ ‘තුරුණු උයන’ යන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේද;

(v) එම එක් එක් ව්‍යාපෘතියේ පරිපාලන ව්‍යුහය හා ඊට සම්බන්ධ පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1076/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී පවත්වන ලද විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් පසුව උතුරු පළාතේ සෞඛ්‍ය සහායක සේවා (III ශ්‍රේණිය) ස්ථිර තනතුරට බඳවාගැනීම සඳහා තෝරාගන්නා ලද සෞඛ්‍ය සහායකයන් 454 දෙනෙකු මේ වනතෙක් බඳවාගෙන නොමැති බවත්;

(ii) මුදල් අමාත්‍යාංශයේ අනුමතිය නොලැබීමෙන් ඉහත බඳවාගැනීම් ප්‍රමාද වී ඇති බවත්;

(iii) ඉහත තනතුරේ පුරප්පාඩු 643ක් පැවතීම, උතුරු පළාතේ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාමට බාධාවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2019 වර්ෂයේ ලබාදී ඇති පත්වීම් ලිපි නොසලකමින් මෙම සෞඛ්‍ය සහායකයන් බඳවාගැනීමට බාධාවක් වී ඇති පරිපාලන හෝ නිත්‍යානුකූල හේතු කවරේද;

(ii) ඔවුන් කඩිනමින් බඳවාගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1084/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් වවුනියාවේ, තච්චංකුලම් ගුවන් තොටුපළ පුළුල් කිරීම සඳහා ඒ අවට පෞද්ගලික ඉඩම් අත්පත් කර ගන්නා ලද අතර එහිදී දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මහජනතාව විසින් භාවිතා කරන ලද මාර්ග භාවිතා කිරීමද තහනම් කර තිබෙන බවත්;

(ii) විශේෂයෙන්ම තච්චංකුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය භාවිතා කිරීම දීර්ඝ කාලයක් තිස්සේ මහජනතාවට තහනම් කර තිබෙන බවත්;

(iii) ඒ හේතුවෙන් තච්චංකුලම් ගම්මානයේ ජීවත්වන ජනතාවට තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරී කාර්යාලයට යාමට කිලෝමීටර් දෙකක් වෙනුවට කිලෝමීටර් දොළහක් ගමන් කිරීමට සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත සඳහන් තච්චංකුලම්-මුන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය මහජනතාවගේ භාවිතය උදෙසා විවෘත කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1092/2025

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'කුඩාඔය' ගඟේ සිට 'දෙබරආර' වැව දක්වා කපන ලද ඇළ මාර්ග ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලද මූලාශ්‍ර කවරේද;

(iv) එම ව්‍යාපෘතියේදී නිසි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතියේ තාක්ෂණික සහාය හා අධීක්ෂණය සපයන ලද ආයතනය කවරේද;

(iii) මෙම ඇළ මාර්ගය කැපීමේදී ඉවත් කරන ලද කළුගල් හා පස් බැහැර කරන ලද ආකාරය කවරේද;

(iv) මේ වනවිට එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කරගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1103/2025

ගරු සුරංග රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ජනාධිපතිවරයාගේ පසුගිය ජර්මානු සංචාරයෙන් ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(ii) එම සංචාරය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම සංචාරයේදී ජනාධිපතිවරයා හමු වූ රාජ්‍ය නායකයන් කවුරුන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1117/2025

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සේවය කර විශ්‍රාම ගොස් සිටින විශාල පිරිසක් පෞද්ගලික ආරක්ෂක සේවාවල සේවය කරන බව දන්නේද;

(ii) ඔවුන්ට සාධාරණ වැටුපක්, ප්‍රමාණවත් පහසුකම්, නිසි පුහුණුවක් සහ නිසි පිළිගැනීමක් ලැබෙන්නේද;

(iii) පෞද්ගලික ආරක්ෂක සේවා නියාමනය කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(iv) නොඑසේ නම්, නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 12 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 60/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— තරුණ දරුවන් විසින් සිය දිවි හානි කර ගැනීම වළක්වා ගැනීම,— පසුගිය කාලය තුළ සෑම පාසලකම උපදේශනය සඳහා ගුරුවරුන් පුහුණු කිරීම, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම උපදේශන අංශයක් පිහිටුවීම, සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම උපදේශන ඒකකයක් පිහිටුවීම, රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාලවල උපදේශන ඩිප්ලෝමා පාඨමාලා, උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම, මානසික අවපීඩන තත්ත්වයන්ට විසඳුම් සෙවීම සඳහා සෑම ප්‍රධාන රෝහලකම මානසික වෛද්‍ය ඒකක පිහිටුවීම ආදිය මඟින් තරුණ දරුවන් සිය දිවි හානි කර ගැනීම වළක්වා ගැනීමට ගත් ක්‍රියාමාර්ග අසාර්ථක වී ඇති හෙයින් දේශපාලන අධිකාරිය, රජයේ නිලධාරින්, විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය සහ මහජනතාව එකී ක්‍රියාමාර්ග කෙරෙහි ගැඹුරින් මැදිහත් විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 61/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවන්හි ළමුන්ට අහිතකර ආහාර අලෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් අතර දියවැඩියාව රෝගය බහුල වශයෙන් හඳුනාගෙන ඇති බව විශේෂඥ වෛද්‍යවරුන් පෙන්වා දී තිබෙන හෙයින්ද, දියවැඩියාව රෝගය සඳහා ආහාර වර්ග මෙන්ම ආහාර පුරුදු සහ ආහාර රටාව හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුල පිහිටි පාසල් ආපනශාලාවන්හි දියවැඩියාව සඳහා හේතු වන්නා වූ සීනි සහ පිටි සහිත ආහාර මෙන්ම ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, ක්ෂණික නූඩ්ල්ස් වැනි ආහාර වර්ග ඉතා විශාල වශයෙන් පාසල් ළමුන්ට අලෙවි කරන හෙයින්ද, අප රටේ පාසල් දරුවන් අතර දියවැඩියා රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා පාසල් ආපනශාලාවල අලෙවි කළ යුතු ආහාරපාන වර්ග පිළිබඳව රජය විසින් යම් සීමාවන් පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට සෘජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේදී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන් මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළි තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ රැකවරණය සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාට්ටු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ රැකවරණය සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථිර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/2025

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා,— ශ්‍රී ලංකාවේ ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස ඉහළ නැංවීම,— විදේශීය අධිකරණ බලපද්ධතීන්වල සිටින බොහෝ උසස් අධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගත යුතු වයස හා සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගැන්වීමේ වයස ඊට වඩා අඩු අගයක් ගන්නා හෙයින්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 67ක් ලෙසත්, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65ක් ලෙසත්, මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63ක් ලෙසත්, විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාවන් ඉහළ දැමීම පිණිස අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම හා ආර්ථිකය සංවර්ධනය කිරීම, — ශ්‍රී ලංකාවේ යාපනය ප්‍රදේශයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම මඟින් මෙරට සංචාරක ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, රැකියා නිර්මාණය කිරීමටත්, යාපනය සජීවී සංස්කෘතික ගමනාන්තයක් ලෙස පිළිබිඹු කිරීමටත් හැකි වන බැවින්, යාපනය සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය ප්‍රධාන සංචාරක කේන්ද්‍ර ලෙස පිළිගැනීමට සහ දේශීය හා විදේශීය සංචාරකයින් ප්‍රදේශයේ හෝටල්, අවන්හල් සහ සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කිරීම, සැබෑ සංචාරක අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයට සංචාරකයින් පැමිණීම සහ ඔවුන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම්, ඩිජිටල් සම්බන්ධතාවය සහ අළෙවිකරණය වැඩි දියුණු කරන ප්‍රතිපත්ති සහ ආයෝජන සඳහා සහාය වන, ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියුතු වූවන් සවිබල ගන්වන සහ සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය කරන සංචාරක සේවා ව්‍යාපාර දිරිමත්

කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම මඟින් යාපනය ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ ආර්ථික වර්ධනය වැඩිදියුණු කරන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම මඟින් සහ මාස 12 සිට 18 දක්වා වූ කාලයක් තුළ තිරසාර ආර්ථික ප්‍රතිලාභ ඉලක්ක කර ගනිමින් ප්‍රදේශයේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා කෙරෙහි එවැනි වැඩසටහන් මඟින් ඇති කරන බලපෑම නිරීක්ෂණය කිරීම මඟින් යාපනය කේන්ද්‍ර කරගත් සංචාරක වේදිකාවක් නිර්මාණය කිරීම සඳහා සහාය දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය හා උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසාර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසාර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/2025

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කිරි නිෂ්පාදන අංශයෙන් ස්වයංපෝෂිතත්වය ප්‍රවර්ධනය කිරීම,— වර්තමානයේ මෙරට සැලකිය යුතු විදේශ විනිමය අහිමි වීමකට මගපාදමින් ආනයනික කිරි නිෂ්පාදන මත යැපෙන හෙයින්ද, උසස් ගව වර්ග, පශු වෛද්‍ය උපස්ථානය, සත්ව ආහාර හා යටිතල පහසුකම් සඳහා සීමිත ප්‍රවේශයක් තිබීම වැනි ගැටළුවලට ගොවීන් මුහුණපාන හෙයින්ද, මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාව වර්ධනය කොට, ග්‍රාමීය රැකියා ජනනය කරමින්, ආනයන මත යැපීම අඩු කර ගත හැකි හෙයින්ද, අභිජනනය සහ පශු වෛද්‍ය සේවා වෙත ප්‍රවිශ්ටය දියුණු කිරීමෙන්, සත්ව ආහාර වගාව ව්‍යාප්ත කිරීමෙන්, ගොවි පුහුණුව හා යටිතල පහසුකම් ශක්තිමත් කිරීමෙන්, කිරි ගොවීන්ට දිරිගැන්වීම් ලබා දීමෙන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීමෙන් සහ කිරිපට්ටි සංවර්ධනය පිළිබඳ පර්යේෂණ දිරිගැන්වීමෙන්, කිරිවලින් ස්වයංපෝෂිතභාවය සාක්ෂාත් කර ගනු පිණිස රජය විසින් ජාතික කිරිපට්ටි සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවටද, අදාළ අමාත්‍යාංශ විසින් පළාත් සභා හා ගොවි කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය වීම සඳහා යාන්ත්‍රණයක් ඇති කරනු ලැබිය යුතු බවටද, අදාළ පාර්ලිමේන්තු කාරක සභාව විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නිර්දේශ කිරීම නිරීක්ෂණය කරනු ලැබිය යුතු බවටද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේදී සහ සවස් කාලයේදී බස් ප්‍රමුඛතා මංතීරු කකඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.